අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/04/59/07/04/04 (2022)    ඔබේ යොමුව / உமது இல. / Your Ref. }    දිනය / திகதி / Date } 2022.02.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

පීඨාධිපතිවරුන්

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2022**

2022 වර්ෂයට නියමිත වාර්ෂික ස්ථාන මාරුවීම් 2022.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කර මේ සමඟ ඔබ වෙත එවමි. අදාළ ස්ථාන මාරුවීම් නියෝග පිළිබඳ නියමිත නිලධරයින්ට දන්වා ඔවුන්ට නව සේවා ස්ථානවල නියමිත දින වැඩ භාර ගැනීමට හැකිවන පරිදි එම නිලධරයින් ඔබගේ ආයතනයෙන් නිදහස් කරලීමට හා ඔවුන් වෙනුවට පැමිණෙන නිලධරයින් වෙත නව සේවා ස්ථානවල වැඩ භාර ගැනීමට හැකිවන ලෙස කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. මෙම ස්ථාන මාරුකිරීම් සිදු කර ඇත්තේ 2021.11.30 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 23/2021 හි සඳහන් පටිපාටියට අනුකූලව වන අතර. තම මාරු ඉල්ලීම් පිළිබඳ වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවේ අවධානය යොමු වී නැත්තම් පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්යය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව අදාළ නිලධරයින්ට අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

03. අභියාචනා ඉල්ලුම්පත්‍රයෙහි ආදර්ශයක් මේ සමඟ අමුණා ඇති අතර ආකෘති පත්‍රය අනුව සකස් කරගත් අභියාචනා ඉල්ලුම්පත් **2022.02.28** දිනට ප්‍රථම මා වෙත එවන මෙන් කාරුණිකව දන්වමි. එම අභියාචනා ඉල්ලුම්පතෙහි ස්කෑන් පිටපතක් (Scan Copy) පහත ආකාරයට විද්‍යුත් තැපෑලෙන් ද යොමු කළ යුතු අතර, **2022.02.28** දිනට පසුව ලැබෙන අභියාචනා සලකා නොබලන බවට ද අදාළ නිලධරයන්ට දැන්විය යුතුවේ.

E- mail = moesltes.branch@gmail.com

Subject = **Appeals on Annual Transfers of the Sri Lanka Teacher Educators' Service - 2022**

(Name & ID No)

04. ඔබ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයෙන් /පළාතට , කලාපයට අයත් ගුරු විද්‍යාලයෙන් / ගුරු මධ්‍යස්ථානයෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන්, **අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන** නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට හැකිවන සේ මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වමි.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය